පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි අංශය (කැලණිය විශ්වවිද්‍යාලය)
பாளி மற்றும் பௌத்தக் கல்விப் பட்டப்
பின்படிப்பு நிறுவகம்
(களனி பல்கலைக்கழகம்)
POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES
(UNIVERSITY OF KELANIYA)

වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2012

வருடாந்த அறிக்கையும் கணக்கும் - 2012

ANNUAL REPORT-2012



O.K.
28/1/13

පටුන

	පිටු අංකය
දර්ශන ප්‍රකාශනය	01
මෙහෙවර ප්‍රකාශනය	02
ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යුහය	03
අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය	04 - 07
ශිෂ්‍ය තොරතුරු සහ විභාග හා මූල්‍ය කටයුතු	08 - 10
අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර	10 - 11
වැඩ සටහන් තොරතුරු	12 - 14
ආයතනයෙහි මූල්‍ය කටයුතු	15 - 17
විගණනය කරන ලද අවසාන ගිණුම් - 2012	18 - 25
පසුගිය වර්ෂ පහක ආයතනයේ මූල්‍ය තත්වය	26
විගණකාධිපති වාර්තාව - 2012 සහ පිළිතුරු	27 - 39

01. දර්ශන ප්‍රකාශනය

දර්ශන ප්‍රකාශනය

බෞද්ධ මූලාශ්‍රය ග්‍රන්ථ, බෞද්ධ චින්තනය හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ සාමූහික අධ්‍යයනයන් හා පර්යේෂණයන් සම්බන්ධීකරණය කෙරෙහි මූලික අවධානයකින් යුතුව ලෝකයේ බෞද්ධ අධ්‍යයන හා පර්යේෂණ සම්බන්ධ ශ්‍රේෂ්ඨතම මධ්‍යස්ථානයක් බවට පත් කිරීමයි.

02. මෙහෙවර ප්‍රකාශනය

මෙහෙවර ප්‍රකාශනය

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයෙහි අවබෝධය, ආකල්ප හා පර්යේෂණ කුශලතාවන් සංවර්ධනය කිරීම සඳහා ශක්ති පමණින් විද්‍යාර්ථීන්ට හොඳම අවස්ථාවන් හා පහසුකම් නිර්මාණය කර දීමේ පුරෝගාමීන් ලෙස කටයුතු කිරීමයි.

03. ආයතනයෙහි පරිපාලන හා අධ්‍යයන ව්‍යූහය

01. කුලපති		ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, මහෝපාධ්‍යාය, පණ්ඩිත, අතිපූජ්‍ය වැලමිටියාවේ ධම්මකීර්ති ශ්‍රී කුසලධම්ම නාහිමිපාණෝ බී.ඒ. ගෞරව (විද්‍යාලංකාර)
02. උපකුලපති		මහාචාර්ය සරත් අමුණුගම මහතා Licence es Lettres (Sorbonne), M.A. (Sorbonne), PhD (Sorbonne), P.G. Dip. (Sorbonne), DESS (Borugogne)
03. අධ්‍යක්ෂ		ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජී.ඩී. සුමනපාල මහතා බී.ඒ. ගෞරව, එම්.ඒ, පීඑච්ඩී, ප්‍රාචීන පණ්ඩිත
04. ලේඛකාධිකාරී		ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා බී.එස්සී Pub. Ad (ශ්‍රී ජයවර්ධනපුර), MSSc. (කැලණිය) SATSL.LICA
05. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී	-	රසිකා සුබසිංහ මහත්මිය
06. ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී	-	පී.බී. අබේසේකර මහතා D.P.F.M. (SLIDA)
07. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී	-	එම්.කේ. ගීතානි අත්තනායක මහත්මිය බී.ඒ. ගෞරව, එම්.ඒ (කැලණිය) MLSc. (කොළඹ)
08. සහකාර ලේඛකාධිකාරී	-	ඩබ්ලිව්.ඩී.ටී. තිලකරත්න මහතා (BSc.)

04. අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය :

(අ) කෙටි හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ මූලාශ්‍රය හා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ උසස් අධ්‍යයන හා පර්යේෂණ සඳහා වෙන් වූ එකම ආයතනයයි. වර්තමානයේ එහි පහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

Course ID	Course Name	Course Sinhala Name	Exam Name
01	Postgraduate Diploma in Buddhist Studies (S/E)	බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය
02	Master of Arts Degree in Buddhist Studies (S/E)	බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය
03	Postgraduate Diploma in Pali Studies (S)	පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	පාලි අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය
04	Master of Arts Degree in Pali Studies (S)	පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය
05	Master of Philosophy (S/E)	දර්ශනපති උපාධිය	දර්ශනපති උපාධි පරීක්ෂණය
06	Doctor of Philosophy (S/E)	දර්ශන විශාරද උපාධිය	දර්ශන විශාරද උපාධි පරීක්ෂණය
07	Postgraduate Diploma course in Buddhist Ayurvedic Counselling (S/E)	බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පරීක්ෂණය
08	Master of Arts Degree Course in Buddhist Ayurvedic Counselling (S/E)	බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව	බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය
Extra Course			
09	Basic Pali & Sanskrit Course		
10	English Through Buddhism		
11	Source Studies, Research Methodology and Logical Thinking		

ඉහත සඳහන් පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් හදාරන ශිෂ්‍ය සංඛ්‍යාවන් පහත දැක්වේ.

ඩිප්ලෝමා - 53
ශාස්ත්‍රපති - 396
දර්ශනපති - 130
දර්ශන විශාරද - 79

මෙම ආයතනය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් විශිෂ්ට ස්ථානයකට පත් කර ලීම අපගේ පරමාර්ථයයි.

(ආ) <u>ජයග්‍රහණ</u>

පසුගිය වසර පහක කාලය තුළ දී පාඨමාලා සංඛ්‍යාව හා ජාතික ජාත්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කිරීමෙන් බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළ කටයුතු උසස් තත්වයකට පත් කිරීමට අප සමත් වී ඇත.

<u>සමත්වූ ශිෂ්‍ය සංඛ්‍යාව</u>

	ජාතික	ජාත්‍යන්තර
1. 2008	281	91
2. 2009	200	140
3. 2010	274	116
4. 2011	206	141
5. 2012	164	133



කැලණිය, මානෙල්වත්ත ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයට අයත් ඉඩමෙන් පර්චස් 40ක කොටසක් වසරකට රු. 10,000/= බදු පදනම යටතේ ලබාදීමටත් මෙම ඉඩමෙහි ආයතනය සඳහා ගොඩනැගිල්ලක් සාදා ගන්නා තෙක් එම ආයතනය සතු ගොඩනැගිලිවල රජයේ තක්සේරුව අනුව බදු මුදලක් ගෙවා ආයතනය පවත්වා ගෙන යාමටත් දෙපාර්ශ්වයේම එකඟතාව ප්‍රකාශ වී ඇත. තව ද ඉඩම සඳහා වන බදු මුදලත් ගොඩනැගිලි සඳහා ගෙවන බදු මුදලෙන් වියදම් හැර ඉතිරිවන මුදලත් වෙනත් දේශීය විදේශීය දානපතියන්ගේ ආධාරත් ලබා ගෙන වසර දෙකක් ඇතුළත ආයතනයේ අවශ්‍යතාවට සරිලන ගොඩනැගිල්ලක පළමු පියවර අවසන් කර දීමටත් මානෙල්වත්ත අධිපති හිමියන් එකඟ වී ඇත. ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධ සියලු කටයුතු මානෙල්වත්ත ආයතනය හා පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය නියෝජනය කරන කමිටුවක් මගින් සංවිධානය කිරීමටත් එකඟ වී ඇත. මානෙල්වත්ත භූමිය ආයතනයට පැවරීම සම්බන්ධ නීතිමය කරුණක් නිරාකරණය කිරීමට ඇති බැවින් එය තරමක් ප්‍රමාද වී ඇත. තවද මෙම කරුණ නිරාකරණය කිරීම පිණිස බෞද්ධ කටයුතු කොමසාරිස් තුමා හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගනිමින් සිටී.

පුද්ගලයන් පහළොස් දෙනෙකු පමණ ප්‍රවාහනය කළ හැකි නවීන වෑන්රථයක් මාර්තු මාසයේදී ආයතනයට ලැබී ඇති අතර තවත් කුඩා වාහනයක් ලබා දෙන බව දන්වා ඇත.

(ඉ) <u>පසුබැසීම් හා සාධාරණීකරණය.</u>

මෙම ආයතනයට වසර තිහකට අධික ඉතිහාසයකට හිමිකම් ඇතත් මේ දක්වා ඊට ස්ථීර භූමිභාගයක් හෝ ගොඩනැගිල්ලක් ලබා ගැනීමට හැකි වී නොමැත. මෙතෙක් මෙම ආයතනය පවත්වා ඇත්තේ කුලියට ලබා ගත් ගොඩනැගිලිවලය. අදාළ බලධාරීන් හා ආයතනයන් දැනුවත් කරමින් මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා අඛණ්ඩ උත්සාහයක් ගෙන ඇතත් මේ දක්වා එය අංග සම්පූර්ණව සාර්ථක වී නොමැත. ආයතනයේ අනාගත සංවර්ධනය කෙරෙහි මෙම ගැටළුව ඉතා අයහපත් ලෙස බලපාන බව සඳහන් කළ යුතුය.

(ඊ) <u>අනාගත සැලසුම්.</u>

බෞද්ධායුර්වේද උපදේශන ප්‍රතිකාර සඳහා මධ්‍යස්ථාන දෙකක් ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර ඒ පිළිබඳ දර්ශනපති හා දර්ශන විශාරද පර්යේෂණ ආරම්භ කිරීමට ද අදහස් කරනු ලැබේ. තවද මේ සඳහා ආයතනයේ 'ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයන අංශයක්' ස්ථාපිත කිරීමට යෝජනා වී ඇත.

(උ) රැකියා තත්ව.

පාලි හා බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා රාශියක් ශ්‍රී ලංකාවේ පවතී. කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, රුහුණු විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලයන්හි පාලි හා බෞද්ධ අධ්‍යයන අංශ ක්‍රියාත්මක වේ. අනුරාධපුර බුද්ධශ්‍රාවක විශ්වවිද්‍යාලය හා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පාලි හා බෞද්ධ අධ්‍යයන සඳහාම වෙන් වූ විශ්වවිද්‍යාල දෙකකි. පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය ද එම විෂය ක්ෂේත්‍රය සඳහාම වෙන් වූ ආයතනයකි. තව ද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන 733ක් පමණ වන පිරිවෙන්වල ප්‍රධාන විෂයධාරාව වනුයේ පාලි හා බෞද්ධ අධ්‍යයනයන්ය. ශ්‍රී ලංකාවේ පාසැල්වල බුද්ධධර්මය හා බෞද්ධ සංස්කෘතිය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව විසිදහසකට ආසන්නය. ඉහත සඳහන් විශ්වවිද්‍යාල, ආයතන හා පාඨශාලාවන්හි අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු සඳහා ආචාර්යවරුන් විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වේ. අප ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා සම්පූර්ණ කරන ලද භික්ෂූන් වහන්සේලා හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් රාශියක් ඉහත සඳහන් ආයතනවල අධ්‍යාපන, පර්යේෂණ කටයුතු වල යෙදී සිටිති. අපගේ අවබෝධයට අනුව මෙම පාඨමාලා අවසන් කළ කිසිවකු තම අභිමතය නිසා මිස රැකියා විරහිතව නොමැති බව සඳහන් කළ යුතුය.

මේ හැරුණු විට වර්තමාන ලෝකයේ ධර්මප්‍රචාරය සඳහා විශාල වශයෙන් භික්ෂූන් වහන්සේලා අවශ්‍ය වී ඇත. අප ආයතනයේ පාඨමාලා අවසන් කළ දේශීය හා විදේශීය භික්ෂූන් වහන්සේලා රාශියක් විදේශ රටවල ධර්ම ප්‍රචාරයේ යෙදී සිටිති.

හොංකොං විශ්වවිද්‍යාලයේ බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ධුරය දරනුයේ ද මෙම ආයතනයේ ආචාර්ය උපාධිය හැදෑරූ ස්වාමීන් වහන්සේ නමකි. ලෝක විශ්වවිද්‍යාල සංගමයේ ලේඛකාධිකාරී හා ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමේ කටයුතු වල යෙදෙන ආචාර්ය කම්මායිධම්මසාමි හිමියෝද මෙහි ආචාර්ය උපාධිය හදාළ කෙනෙකි. කාම්බෝජයේ විශ්වවිද්‍යාලයක ප්‍රධාන විධායක නිලයක් දරනුයේ අප ආයතනයේ අධ්‍යයන කටයුතු සිදු කළ හිමි නමකි. තව ද ලෝකයේ බෞද්ධ ආයතන රැසක අප ආයතනයේ පශ්චාත් උපාධි ලබාගත් ශිෂ්‍ය හිමිවරු සේවය කරති. මේ අයුරින් සලකා බලන විට අප අධ්‍යයන ආයතනයේ පාඨමාලා සම්පූර්ණ කරන සියලු දෙනාටම රැකියා අවස්ථා රාශියක් දේශීයව හා දේශාන්තරව පවතින බව සඳහන් කළ හැකිය.

මෙම ආයතනය පශ්චාත් උපාධි ආයතනයක් නිසා බොහෝ විට ලියාපදිංචි වී සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙක් රැකියා වල නිරත වූ අය වෙති. ඔවුහු ඔවුන්ගේ උසස්වීම් සඳහා මෙහිදී පශ්චාත් උපාධි හදාරන අය වෙති.එමෙන්ම තවත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පිරිසක් රැකියාවෙන් පසු විශ්‍රාම ලබා බෞද්ධ අධ්‍යයනය හදාරති. එමනිසා රැකියා පිළිබඳ ගැටලුවක් මෙම උපාධිධාරීන් සම්බන්ධයෙන් උද්ගත නොවන බව සඳහන් කළ යුතුය.

05. සම්පත් හා ශිෂ්‍ය සංඛ්‍යා ලේඛනය - 2012

පාඨමාලාව	ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	අධ්‍යයන කාර්ය මණ්ඩලය	සම්පූර්ණ අනධ්‍යයන කාර්යය මණ්ඩලය
බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය)	09	ස්ථිර කාර්ය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය - 01 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය i - 02 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ii - 02 (2012.07.31 සිට) විද්‍යාත්මක සහකාර - 02	
බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය)	29		
බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය)	189		
බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය)	207		
පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය)	20		
බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍යය)	14		
බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව (සිංහල මාධ්‍යය)	21		
බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව (සිංහල මාධ්‍යය)	90		
බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය)	40		
බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව (සිංහල මාධ්‍යය)	29		
බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍යය)	40		
බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව- බාහිර (ඉංග්‍රීසි මාධ්‍යය)	05		
බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- බාහිර	08		
	701	07	18

06. පාඨමාලාව සම්පූර්ණ කළ දේශීය සිසුන් - 2012

පාඨමාලාව	මාධ්‍යය	2012 විභාගයට පෙනී සිටි	2011 විභාගයට පෙනී සිටි
බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	සිංහල	09	10
බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	ඉංග්‍රීසි	05	06
බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව	සිංහල	132	166
බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව	ඉංග්‍රීසි	07	16
පාලි අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව	සිංහල	16	16
බෞද්ධායුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	සිංහල	08	20
බෞද්ධායුර්වේද උපදේශන ශාස්ත්‍රපති පාඨමාලාව	සිංහල	16	11
බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව	සිංහල	01	--
බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව	ඉංග්‍රීසි	--	--
බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව	සිංහල	01	--
බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව	ඉංග්‍රීසි	01	03
		198	248

07. පාඨමාලාව සම්පූර්ණ කළ විදේශීය සිසුන් - 2012

පාඨමාලාව	මාධ්‍යය	2012 විභාගයට පෙනී සිටි	2011 විභාගයට පෙනී සිටි
බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	ඉංග්‍රීසි	16	04
බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව	ඉංග්‍රීසි	174	149
බෞද්ධ අධ්‍යයන දර්ශනපති පාඨමාලාව	ඉංග්‍රීසි	--	02
බෞද්ධ අධ්‍යයන දර්ශන විශාරද පාඨමාලාව	ඉංග්‍රීසි	02	07
බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව- බාහිර	ඉංග්‍රීසි	08	05
බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති පාඨමාලාව- බාහිර	ඉංග්‍රීසි	05	05
		205	172

08. අධ්‍යයන කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුව	විෂය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	කථිකාචාර්ය
බෞද්ධ දර්ශන අධ්‍යයන අංශය			1				
බෞද්ධ සංස්කෘති අධ්‍යයන අංශය			-		2		
බෞද්ධ මූලාශ්‍රය අධ්‍යයන අංශය			-		2		
එකතුව			1		4		

09. අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

පීඨය/අංශය	ජ්‍යෙෂ්ඨත්වයෙන් වැඩි	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	කණිෂ්ඨ කාර්ය මණ්ඩලය	සුළු සේවක
පාලන අංශය	*ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී - 01	*ලිපිකරු i ශ්‍රේණිය -01 *ලසුලේඛක (සිංහල) i ශ්‍රේණිය - 01 *ලිපිකරු iii ශ්‍රේණිය- 02	*රියදුරු Ii ශ්‍රේණිය-02	*කම්කරු :විශේෂ ශ්‍රේණිය) - 02 කම්කරු (iii ශ්‍රේණිය) - 01
ගිණුම් අංශය	*ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී - 01	*ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (ලිපිකරු) - 01 *ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර (පොත් තබන්නා) - 01 *සරප් මාණ්ඩලික සහකාර - 01 ගබඩා භාරකරු iii ශ්‍රේණිය - 01		
පුස්තකාලය	*ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී - 01	*පුස්තකාල සහකාර ii ශ්‍රේණිය - 02	*පුස්තකාල සහායක ii ශ්‍රේණිය- 01	
විභාග හා ශිෂ්‍ය කටයුතු අංශය	*සහකාර ලේඛකාධිකාරී - 01	*පරිගණක යෙදුම් සහකාර iii ශ්‍රේණිය - 01		
එකතුව	04	11	03	03

10. පර්යේෂණ, නව සම්පාදන සහ ප්‍රකාශන :

2012 වර්ෂයේදී ප්‍රදානය කරන ලද පර්යේෂණ උපාධි

නම	උපාධිය	පර්යේෂණ උපාධි මාතෘකාව හා උපදේශකවරු	අපේක්ෂකයාගේ රට
Mr. L.H. Chandrasena	දර්ශන විශාරද	An Analysis of the Religio-Philosophical Views of 'Devas' as Embodied in Pāli Canon and Commentaries.	ශ්‍රී ලංකාව
නානායක්කාරවසම් තෙලිකඩ පල්ලියගුරුගේ මෝහාන් නන්දන මහතා	දර්ශනපති	පැරණි ලාංකේය බෞද්ධ චිත්‍ර කලාවේ විශේෂ ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්.	ශ්‍රී ලංකාව
Miss. Kustiani	දර්ශන විශාරද	An Analytical Study of the Psychological Basis of Buddhist Ethics.	ඉන්දුනීසියාව
Ven. Ashon Nyanuttara	දර්ශන විශාරද	A Historical and Cultural Study of the Influence of Buddhism on Inhabitants of Arakan State.	මියන්මාරය

11. වැඩසටහන්, දේශන හා වැඩමුළු :

(අ) <u>පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව</u>

<u>ආචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා</u>
සිංහල - 03
ඉංග්‍රීසි - 03

<u>පූජ්‍ය මඩිහේ සුගතසිරි හිමි</u>

ආයතනයෙහි පර්යේෂණ අංශය මගින් අන්වේෂණ සහරාව එළි දක්වා ඇති අතර පර්යේෂණ වැඩමුළු කිහිපයක් ආයතනයේ ආචාර්යවරුන්ගේ හා බාහිර ආචාර්යවරුන්ගේ සහභාගිත්වයෙන් සිදු කොට ඇත. තවද සහරා රාශියකට පර්යේෂණාත්මක ලිපි ද මෙම ආයතනයෙහි පර්යේෂණ ඒකකයේ පර්යේෂකයන් විසින් සපයා ඇත.

(ආ) පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව

ආචාර්ය වසන්ත ප්‍රියදර්ශන මහතා

සිංහල - 02
ඉංග්‍රීසි - 02

දිනය	දේශක	මාධ්‍යය	මාතෘකාව
2012.06.09	ආචාර්ය ඩී.ඩී. සේනාධීර මහතා	සිංහල	පශ්චාත් උපාධි පර්යේෂණ කාර්ය සඳහා මූලාශ්‍රයාගත දත්ත රැස් කිරීමේ හා විශ්ලේෂණය කිරීමේ ක්‍රම.
2012.08.03	මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා මහාචාර්ය රත්න විජේතුංග මහතා	ඉංග්‍රීසි ඉංග්‍රීසි	The Potential Goals to be expected from a Post Graduate Research. The Data Collection from Source Materials and its Analytical Methods in Postgraduate Research Work.
2012.09.08	මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ මහතා	සිංහල	පශ්චාත් උපාධි පර්යේෂණයකදී ද්විතීයික මූලාශ්‍රය භාවිතය.
2012.09.08	ආචාර්ය වසන්ත ප්‍රියදර්ශන මහතා	සිංහල	පශ්චාත් උපාධි පර්යේෂණ ක්‍රියාවලියේදී උද්‍යෝගිමත් මනසක් පවත්වා ගෙන යාමේ ක්‍රම.

පර්යේෂණ පත්‍රිකා

ආචාර්ය පී.ආර්. වසන්ත ප්‍රියදර්ශන මහතා

1. චිත්තපීඩා, නිවන් මඟ සඟරාව
2. ස්ත්‍රී මනෝ විද්‍යාව, සාරදා සඟරාව
3. Psychotherapeutic value of the Visuddhimagga, Thailand Conference.
4. Kalukumara Syndrome, India
5. Feminism and Buddhism, Buddhist and Pali University Conference.
6. Buddhist Analysis of Mental Disorders , I.B.C.

ඩබ්ලිව්.එම්.දේශප්‍රිය ගුණසේන මහතා

ශාස්ත්‍රීය ලිපි

1. ලෝකෝත්තර චිත්ත හා නිර්වාණය
   නිවන් මග, රජයේ මුද්‍රණාලයේ ප්‍රකාශනය, 2012

2. පාලි කාව්‍ය විචාර මූලධර්ම කෙරෙහි සංස්කෘතයේ ආභාසය
   අනුදීපනා ශාස්ත්‍රීය සංග්‍රහය, 2012

3. පාලි හා බෞද්ධ අධ්‍යයනය : නූතන ප්‍රවණතා හා අනාගත අවශ්‍යතා, සුබෝධ ශාස්ත්‍රීය සංග්‍රහය, 2012

4. ථෙරවාද සම්ප්‍රදාය තහවුරු කිරීමෙහි ලා ශ්‍රී ලාංකේය දායකත්වය , යාත්‍රා ශාස්ත්‍රීය සංග්‍රහය, 2012

5. Nibbāna : Ideal aim of the Buddha's Teaching, Sinhala Bauddhayā, Centenary Commemorative Volume, 2012.

6. Lōka Sāmaggiyassa Uddisāya Mettā Bhāvanā, Theravada Buddhism: origin, Identity and Development Conference Volume, Myanmar, 2012.

ශාස්ත්‍රීය ග්‍රන්ථ

1. ශ්‍රමණ සම්ප්‍රදායයේ ඓතිහාසික පසුබිම හා බුදුසමයේ අනන්‍යතාව, සරස්වති ප්‍රකාශනය 2012

12. ත්‍යාග ප්‍රදානයන්

විෂය	තිළිණ ප්‍රමාණය	ප්‍රදානය
(අ) දේශීය තිළිණ ලාභීන්	2	ස්වර්ණ මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති) පූජ්‍ය දෑරංගල කුසලඤාණ හිමි
		රජත මුද්‍රිකාව - (බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා) නාලනී ජයන්ති විතානගේ මහත්මිය
එකතුව	2	

13. අලුතින් ආරම්භ කළ පාඨමාලා : නැත

14. පුනරාවර්තන වියදම් -

විෂයය	2011 රු.ශත	2012 රු.ශත	වෙනස
(අ) වැටුප් හා වේතය	15,839,479	18,595,187	2,755,708
(ආ) ගමන් වියදම්	286,507	469,260	182,753
(ඇ) සැපයුම්	1,186,764	1,681,806	495,042
(ඈ) නඩත්තු	443,957	512,393	68,436
(ඉ) බැඳුම්ගත සේවා	6,579,979	7,741,277	1,161,298
(ඊ) වෙනත්	4,103,935	6,074,209	1,970,274
එකතුව	28,440,621	35,074,132	6,633,511

15. ප්‍රාග්ධන වියදම් -

විෂයය	2011 (රු.ශත)	2012 (රු.ශත)	වෙනස
(අ) ලී බඩු සහ කාර්යාලයීය උපකරණ මිළදී ගැනීම.	799,814	813,167	-13,353
(ආ) යන්ත්‍ර උපකරණ මිළදී ගැනීම.	0	0	0
(ඉ) ගොඩනැගිලි	0	0	0
(ඊ) වෙනත්	225,691	442,294	-216,603
එකතුව	1,025,505	1,255,461	-229,956

16. මූල්‍යමය ප්‍රගතිය (වියදම්) -

විෂයය	වෙන් කිරීම්		වියදම		අතිරික්ත/ඌනතාව (රු.ශත)	
	2011	2012	2011	2012	2011	2012
(අ) පුනරාවර්තන (ව්‍යාපෘති හැර)	33,559,000	35,785,000	28,440,621	35,074,132	5,118,379	710,868
(ආ) ප්‍රාග්ධන (ව්‍යාපෘති හැර)	1,000,000	1,600,000	997,056	1,255,460	2,944	344,540
(ඇ) ව්‍යාපෘති - දේශීය ආයෝජන	0	0	0	0	0	0
(ඇ) ව්‍යාපෘති - විදේශීය ආයෝජන	0	0	0	0	0	0
එකතුව	34,559,000	37,385,000	29,437,677	36,329,592	5,121,323	1,055,408

17. මූල්‍යමය ප්‍රගති විස්තරය (උපයන ලද ආදායම) -

ආදායම් මාර්ග	වෙන් කිරීම් (රු. ශත)		එකතුව (රු.ශත)		වෙන් කිරීම් (රු.ශත)	එකතුව (රු.ශත)
	2011	2012	2011	2012		
(අ) උපාධි අපේක්ෂක	0	0	0	0	0	0
(ආ) පශ්චාත් උපාධි	19,650,000	20,250,000	19,756,133	21,826,219	-106,133	-1,576,219
(ඇ) උපදේශන සේවා	0	0	0	0	0	0
(ඇ) වෙනත්	1,800,000	5,535,000	2,051,000	2,238,483	-251,000	3,296,517
එකතුව	21,450,000	25,785,000	21,807,133	24,064,702	-357,133	1,720,298

18. මූල්‍ය ප්‍රගති විශ්ලේෂණය - 2012

විෂයය	ක්‍රමය	එක් සිසුවකු සඳහා වියදම	
		2011	2012
(අ) එක් සිසුවකු සඳහා පුනරාවර්තන වියදම	පුනරාවර්තන වියදම ශිෂ්‍ය සංඛ්‍යාව	47,322	50,034
(ආ) එක් සිසුවකු සඳහා ප්‍රාග්ධන වියදම	ප්‍රාග්ධන වියදම ශිෂ්‍ය සංඛ්‍යාව	1,706	1,791
එකතුව		49,028	51,825

19. වාර්තාව සඳහා අදාළ වෙනත් තොරතුරු.

01. 2008- 2012 දක්වා ආයතනයේ මූල්‍ය තත්වය.
02. අවසාන ගිණුම් - 2012
03. කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(02) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු.

Postgraduate Institute of Pali and Buddhist Studies

(University of Kelaniya)

Final Accounts

2012

Sunethra Mahadevi Piriven

Vidyayathana Premises

Pepiliyana, Boralesgamuwa.

2012 වර්ෂයේ මුල්‍ය කටයුතු පිළිබඳ වාර්තාව -

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ කැලණිය විශ්විද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනයේ තිස් හතරවැනි (34) වර්ෂයේ මුල්‍ය කටයුතු පිළිබඳ වාර්තාවයි.

2012 වර්ෂය සඳහා ලැබුණු ආධාර ප්‍රමාණය මෙසේ ය.

පුනරාවර්තන ආධාර	රු. 6,500,000.00
102- මූලධන ආධාර	රු. 1,600,000.00

රජයෙන් ලැබුණු ආධාර මුදල් ද ඇතුළුව මෙම වර්ෂයේ සම්පූර්ණ පුනරාවර්තන ආදායම රුපියල් තුන්කෝටි විසිතුන්ලක්ෂ හැටහතරදහස් එකසිය හැටතුන (රු. 32,364,163)ක් වූ අතර පුනරාවර්තන වියදම රුපියල් තුන්කෝටි පනස්ලක්ෂ හැත්තහතරදහස් එකසිය තිස්දෙක (රු. 35,074,132)ක් විය. මේ අනුව පුනරාවර්තන මුල්‍ය කටයුතුවල ප්‍රතිඵලය රුපියල් විසිහත්ලක්ෂ නමදහස් නමසිය හැටනමයක (රු. 2,709,969) ඌණතාවකි.

G. D. Sumanapala

(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජී. ඩී. සුමනපාල)

අධ්‍යක්ෂ

2012 වර්ෂයේ වාර්ෂික ගිණුම් පිළිබඳ මුල්‍යාධිකාරීගේ වාර්තාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක 63 (8) ඡේදයේ ප්‍රකාර මුල්‍යාධිකාරී විසින් කොමිෂන් සභාවේ සභාපති වෙත සැපයිය යුතු වාර්තාවයි.

ඉහත සඳහන් වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද මෙම ආයතනයේ ගිණුම් වාර්තාව කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන පොත්පත් හා ලේඛන අනුසාරයෙන් සකස් කරන ලද බවත් මාගේ වැටහීම හා විශ්වාසය අනුව එය සත්‍ය හා නිවැරදි බවත් සහතික කරමි.

ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය
2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

වත්කම්	2012-12-31		2011-12-31	
ජංගම නොවන වත්කම්	රු.	රු.	රු.	රු.
දේපළ යන්ත්‍ර හා උපකරණ (උපලේඛන එච්)	11,340,717		4,157,237	
ආයෝජන (උපලේඛන ජේ, ජේ-1, ජේ-2)	6,297,806		5,512,045	
වෙනත් මූල්‍ය වත්කම් (උපලේඛන ජේ-3)	740,949	18,379,473	662,365	10,331,646
ජංගම වත්කම්				
ගබඩා අත්තිකාරම් (උපලේඛන කේ)	338,602		456,250	
පර්යේෂණ හා ප්‍රකාශන තොග (උපලේඛන එල්-1)	1,184,437		1,146,946	
විවිධ ණයගැතියෝ (උපලේඛන එල්)	292,021		174,827	
කාර්ය මණ්ඩල අත්තිකාරම් (උපලේඛන එම්)	3,083,704		2,971,558	
සේවා හා සැපයුම් අත්තිකාරම් (උපලේඛන ඕ)	47,962		47,950	
ඉදිරි ගෙවීම් (උපලේඛන එස්)	33,756		11,070	
මුදල් හා මුදල් හා සමාන දෑ (උපලේඛන ටී-1)	6,477,454		5,449,932	
වෙනත් තැන්පත් (උපලේඛන ටී-4)	4,760,000	16,217,936	4,710,000	14,968,531
මුළු වත්කම්		34,597,409		25,300,178
බැරකම්				
ජංගම බැරකම්				
තැන්පත් (උපලේඛන යූ)	35,204.00		35,204.00	
විවිධ ණයහිමියෝ (උපලේඛන වී)	50.00		50.00	
උපචිත වියදම් (උපලේඛන ඩබ්ලිව්)	1,730,293.20		549,236.12	
වෙනත් වගකීම් (උපලේඛන ඉසෙයිඩ්)	217,621	1,983,168	132,748.87	717,239
ජංගම නොවන බැරකම්				
වැය වූ මූලධන ආධාර (උපලේඛන ඒ)	11,751,062		11,669,444	
වැය නොවූ මූලධන ආධාර (උපලේඛන ඒ-1)	777,262	12,528,325	432,723	12,102,166
සීමිත අරමුදල්				
විශේෂ අරමුදල් (උපලේඛන ඩී)	5,366,719		4,623,555	
පර්යේෂණ අරමුදල් (උපලේඛන ඊ)	904,789		863,412	
ත්‍යාග සහ ආධාර (උපලේඛන එෆ්)	10,496,042		1,827,160	
වෙනත් අරමුදල් (උපලේඛන ජී)	1,815,621		1,436,415	
පාරිතෝෂික වෙන්කිරීම් (උපලේඛන බී)	4,504,383	23,087,555	4,021,900	12,772,442
මුළු බැරකම්		37,599,047		25,591,847
ශුද්ධ වත්කම්		(3,001,638)		(291,669)
ශුද්ධ වත්කම්/ස්කන්ධය				
මූලධන ලැබීම්				
ප්‍රත්‍යාගණන ගිණුම	798,276		789,276	798,276
ආයතනයේ පොදු සංචිතය (උපලේඛන බී-1)	(3,799,915)		(1,089,945.52)	(1,089,946)
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය		(3,001,638)		(291,669)

G. D. Sumanapala

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජී. ඩී. සුමනපාල
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

පී. බී. අබේසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය
2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	2012.12.31		2011.12.31	
මෙහෙයුම් ආදායම්				
පුනරාවර්තන වැය සඳහා රජයේ ආධාර	6,500,000		7,314,146	
ණය පොලී	127,271		126,145	
පැරණි භාණ්ඩ වෙළඳාම	-		-	
විවිධ ආදායම් (උපලේඛන 1)	500,090		499,931	
ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි)	618,000		577,000	
පාඨමාලා ගාස්තු (පශ්චාත් උපාධි)	19,837,441		15,711,930	
විභාග ගාස්තු (පශ්චාත් උපාධි)	161,000		237,500	
පුස්තකාල ගාස්තු (පශ්චාත් උපාධි)	570,000		555,750	
ග්‍රන්ථ අලෙවිය	8,643		1,864	
පුස්තකාල දඩ	3,775		6,960	
වෙනත් ව්‍යාපෘති ආදායම්	2,238,483		2,051,000	
කපා හැරීම්	1,158,314		1,317,208	
වෙනත් මෙහෙයුම් ආදායම්	641,147		721,846	
මෙහෙයුම් ආදායම් එකතුව		32,364,163		21,121,279
මෙහෙයුම් වියදම්				
පුද්ගලික වැටුප් හා වේතන				
පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා (උප.02)	9,487,571		9,727,685	
අධ්‍යයන සේවා (උප.02)	9,107,616		6,111,794	
ගමන් වියදම්	469,260		286,507	
සැපයීම්	1,681,866		1,186,764	
අළුත්වැඩියා හා නඩත්තු වියදම්	512,393		443,957	
ප්‍රවාහන, සන්නිවේදන හා ආවශ්‍යක සේවා	7,741,277		6,579,979	
ක්ෂය කිරීම් හා හිලව් වියදම්	3,054,273		1,481,641	
වෙනත් මෙහෙයුම් වියදම්	3,019,876		2,622,294	
මෙහෙයුම් වියදම් එකතුව		35,074,132		25,818,327
ක්‍රියාකාරී මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය		(2,709,969.04)		680,658
මූල්‍යමය පිරිවැය				
දේපල උපකරණ අලෙවියෙන් ලත් ආදායම		-		-
අදාල කාලයට ශුද්ධ අතිරික්තය/ඌණතාවය		(2,709,969)		680,658
පසුගිය වර්ෂයෙන් ඉදිරියට ගෙන ආ ශේෂය		(1,089,946)		(1,770,603)
අදාළ වර්ෂයේ අතිරික්තය/ඌණතාවය		(2,709,969)		680,658
ආයතනයේ පොදු සංචිතය		(3,799,915)		(1,089,946)

නිවැරදි බවට සහතික කරමු.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජී. ඩී. සුමනපාල
අධ්‍යක්ෂ
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

ජී. බී. අබේසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් පුවාහ ප්‍රකාශය

	2012.12.31		2011.12.31	
	රු.	රු.	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය				
වර්ෂය සඳහා අතිරික්තය (ඌණතාවය)		(2,709,969)		680,658
මුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයයන් සඳහා ගැලපීම				
පාරිතෝෂික		482,483		(486,965)
ක්ෂය		2,551,362		1,481,051
කපා හැරීම		(1,158,314)		(1,317,208)
		(834,439)		357,536
ඉකුත් කාලපරිච්ඡේදවල විෂයයන්		-		-
කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය		(834,439)		357,536
කාරක ප්‍රාග්ධන විෂයයන්ගේ වෙනස්වීම්				
ගබඩා අත්තිකාරම් සහ පර්යේෂණ හා ප්‍රකාශන				
තොග (වැඩිවීම)/අඩුවීම	80,157		43,872	
විවිධ ණයගැතියෝ (වැඩිවීම)/අඩුවීම	(117,194)		42,685	
කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම	(112,146)		7,591	
සේවා සැපයීම අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම	(12)		(46,950)	
ඉදිරි ගෙවීම් (වැඩිවීම)/අඩුවීම	(22,686)		29,064	
වෙනත් තැන්පත් (වැඩිවීම)/අඩුවීම	(50,000)		-	
තැන්පත් හා විවිධ ණයහිමියෝ (වැඩිවීම)/අඩුවීම	-		11,125	
උපචිත වියදම් හා වෙනත් බැරකම් (වැඩිවීම)/අඩුවීම	1,265,929	*1,044,048*	(1,343,670)	(1,256,283)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ අගය		209,610		(898,747)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය				
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(1,081,489)		(996,376)	
වෙනත් ආයෝජන	(864,346)		(347,302)	
ආයෝජන ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල්		(1,945,835)		***(1,343,678)***
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය				
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය	1,600,000		750,000	
ත්‍යාග සහ ආධාර	-		-	
වෙනත් අරමුදල්	1,163,748		551,502	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල්		2,763,748		1,301,502
මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශුද්ධ වැඩිවීම		1,027,523		***(940,923)***
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය		5,449,932		6,390,855
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශේෂය (සටහන1)		6,477,455		5,449,932

සටහන1	2012	2011
	රු.	රු.
බැංකු ශේෂය	6,477,454	5,449,932
වෙනත් බැංකු ශේෂ	-	-
	6,477,454	5,449,932

ගිණුම් ප්‍රතිපත්ති

01. **ගණකාධිකරණ මූලධර්ම**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පිළිගත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇත.

02. **ක්ෂය කිරීම්**

සරල මාර්ග පදනම මත ජංගම නොවන වත්කම්වල ක්ෂය ප්‍රතිපාදන සලසා ඇත.

	ප්‍රතිශතය
102- ලී බඩු හා සවිකිරීම	10%
102- කාර්යාලීය ලී බඩු හා උපකරණ	20%
102- විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ	20%
102- පුස්තකාල පොත් සහ වාර සඟරා	20%
102- රථවාහන	20%

03. **තොග**

ගබඩා තොග ගත්මිලට ආගණනය කර ඇත. ව්‍යාපාරික අරමුණක් නොමැති බැවින් සියළු මිලදී ගැනීම් හා නිකුත් කිරීම් ගත්මිල මත ගබඩා තොග අත්තිකාරම් ගිණුමේ දක්වනු ලබන අතර එම ගිණුමේ ශේෂය මගින් අවසන් තොග නියෝජනය කෙරේ.

04. **ණයගැතියෝ**

ණයගැතියන් ලෙස දැක්වෙන්නේ කාර්ය මණ්ඩලය වෙත ගෙවනු ලබන ණය හා අත්තිකාරම් වේ. මෙම ණය හා අත්තිකාරම් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ ශේෂය ඇපයට තබා ලබා දෙන බැවින් ආපසු අයකර ගැනීමේ අවධානමක් නැත. ඒ අනුව බොල් ණය හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන සලසා නැත.

05. **ස්ථාවර වත්කම් (ජංගම නොවන වත්කම්)**

ජංගම නොවන වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර ශුද්ධ අගය දැක්වෙන පරිදි දක්වා ඇත.

06. **පාරිතෝෂික දීමනා**

විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

07. 2010.02.11 සහ 2010.09.06 දිනයන්හි රු. 625,000.00 සහ රු. 800,000.00 ක වටිනාකමින් යුතුව නැවත මිල සහතික කරන ලද වාහන වල වාහනයේ නැවත මිල අගය කළ දිනය ලෙස පිළිවෙලින් 2010.02.28 සහ 2010.09.30 යන දිනයන් ගණන් කර ක්ෂය කිරීම් කර ඇත.

2008 – 2012 දක්වා ආයතනයේ මූල්‍ය තත්වය.

වර්ෂය	පුනරාවර්තන සඳහා රජයේ ආධාර	102 - මූලධන සඳහා රජයේ ආධාර	තොරතුරු තාක්ෂණ සඳහා රජයේ ආධාර	ආයතනික ඉපයීම්	මුළු පුනරාවර්තන ආදායම	මුළු පුනරාවර්තන වියදම	පුනරාවර්තන මූල්‍ය කටයුතු වල ප්‍රතිඵලය
2008	8,000,000	--	--	12,948,436	20,948,436	21,787,873	(839,437)
2009	6,000,000	85,000	--	17,955,534	23,955,534	23,245,122	710,412
2010	7,900,000	400,000	--	28,878,711	28,878,711	25,070,959	3,807,753
2011	7,314,146	750,000	--	29,121,279	29,121,279	28,440,621	680,658
2012	6,500,000	1,600,000	--	25,864,163	32,364,163	35,074,132	-2,709,969

25. කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(02) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සහ පිළිතුරු.

විගණකාධිපති දෙපාර්තමේන්තුව

கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்

AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: පී.ඒ.ජී/පාලි/ඒ.ඉ/2012

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2013 ඔක්තෝබර් 31 දින

11 NOV 2013

අධ්‍යක්ෂ,

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය,

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
වැඩ බලන විගණකාධිපති

පිටපත් :-
01. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
02. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
03. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
04. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

13.11.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
පැක්ස් අංකය / பக்ஸ் இல / Fax No: 2887223
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
ඉලෙක්ට්‍රොනික් තැපෑල් / மெயில் / E-mail: oaggov@sltnet.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: රසී/එෆ් /පිඅයිපීබී /එෆ්ඒ/2012 | ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date: 2013 ඔක්තෝබර් 31 දින

අධ්‍යක්ෂ,
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය,

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1979 අංක 08 දරන පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 23 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්ති සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත 2013 අගෝස්තු 12 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

13.11.2013.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
පැක්ස් අංකය / பக்ஸ் இல / Fax No: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / மின்னஞ்சல் / E-mail: oaggov@sltnet.lk

1.3 **විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද, ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2. 2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

ර.ඩබ්ලිව්. ගුණතිලක අරමුදලේ ආයෝජනය සහ වෙනත් ආයෝජන 03 කට අදාළව 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලිය රු.71,170 ක් ගිණුම් ගත කර නොතිබුණි.

2.2.3 **නීති රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය	
(i) XX වන ජේදයේ 3(1) වගන්තිය සහ X වන පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය	සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා රු.8,425,286 ක වැටුප් හා දීමනා ගෙවා ඇත ත් , ආයතන සංග්‍රහය ප්‍රකාරව පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීම සඳහා සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා අදාළ පොත්පත් ලේඛන නඩත්තු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ.104 (2)	2012 වර්ෂයේදී සිදු වී තිබුණු වාහන අනතුරකට අදාළ මූලික පරීක්ෂණ වාර්තා 2013 අගෝස්තු 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මු.රෙ. 371	2012 වර්ෂයේ නිකුත් කර තිබුණු රු.81,627 ක් වූ අත්තිකාරම් 05 ක් 2013 ජුනි 06 දින වන විටත් පියවා නොතිබුණි.
(iii) මු.රෙ. 756	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	2012 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.26,332,811 ක්වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	වාහනයක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 9,209,969 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.6,633,488 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 6,500,000 ක ප්‍රදාන හේතු කොටගෙන එම ඌනතාවය රු.2,709,969 ක් දක්වා අඩු වී තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.7,314,146 ක ප්‍රදාන හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු.680,658 ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,390,627 ක පිරිහීම සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ වැටුප් හා දීමනා රු. 2,995,822 කින් වැඩිවීම සහ ගිවිසුම් ගත සේවා වියදම් රු. 1,161,298 කින් වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

අධ්‍යයන වර්ෂ 03 කට අදාළව ආයතනය විසින් පවත්වන ලද එක් අවුරුදු පාඨමාලා 07 ක සාරාංශ ගත තොරතුරු පහත පරිදි විය.

අධ්‍යයන වර්ෂය	ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව	අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව	සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව	අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව	අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව
					සියයට
2009/ 2010	404	389	357	32	8.23
2010/ 2011	469	408	336	72	17.65
2011/ 2012	464	393	311	82	20.87

පහත සඳහන් නිර්ක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍ය ලියාපදිංචිය

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමස්ථ ශිෂ්‍ය ලියාපදිංචියේ සැලකිය යුතු විචලනයක් පෙන්නුම් නොකළද , පාලි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සිංහල) හා බෞද්ධ ආයුර්වේද උපදේශන පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල) සඳහා ශිෂ්‍ය ලියාපදිංචියේ පිළිවෙලින් සියයට 33 ක හා සියයට 59 ක අඩුවීමක් තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ආයතනය එක් අවුරුදු පාඨමාලා 07 ක් පවත්වා තිබූ අතර, ශිෂ්‍යයින්ගේ වැඩි දායකත්වයක් බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි (සිංහල) හා බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි (ඉංග්‍රීසි) පාඨමාලාවට වූ අතර, එම පාඨමාලා දෙකෙහි ශිෂ්‍ය ලියාපදිංචිය සමාලෝචිත වර්ෂයේ මුළු ශිෂ්‍ය ලියාපදිංචියෙන් සියයට 80 ක් විය.

(iii) ආයතනය විසින් බෞද්ධ අධ්‍යයන ශාස්ත්‍රපති උපාධි පාඨමාලා 02 ක් පවත්වන අතර එයින් ඉංග්‍රීසි පාඨමාලාව සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 7.2 කින් වැඩිවී තිබුණද , සිංහල පාඨමාලාව සඳහාවූ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 10.5 කින් අඩුවී තිබුණි.

(ආ) විභාගවලට පෙනී සිටීම හා විභාග ප්‍රතිඵල

(i) 2012 වර්ෂයේ ලියාපදිංචි සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව 464 ක් වුව ද , විභාග වලට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 393 ක් පමණක් විය. ඒ අනුව පෙනී නොසිටි සංඛ්‍යාව 71 ක් විය.

(ii) සමාලෝචිත වර්ෂය තුල විභාග වලට පෙනී සිටි 393 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 311 ක් වූයෙන් එහි ප්‍රතිශතය සියයට 79 ක් විය.

4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පර්යේෂණ කාර්යයන් සඳහා 1984 වර්ෂයේ ආරම්භ කර තිබුණු ර්.ඩබ්ලිව් ගුණතිලක අරමුදල, කිසිදු පර්යේෂණ කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණ අතර 2012 දෙසැම්බර් 31 දිනට අරමුදලේ වටිනාකම රු.206,166 ක් විය.

(ආ) 1991 වර්ෂයේ දී ලැබී තිබුණු රු.133,149 ක් වූ විදේශ ශිෂ්‍යත්ව ආධාර, ඉතිරිකිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණු අතර 2012 දෙසැම්බර් 31 දිනට එහි වටිනාකම රු.700,394 ක් විය. කෙසේ වෙතත් අරමුණුගත කාර්යය වූ විදේශ ශිෂ්‍යත්ව ආධාර ප්‍රදානය සඳහා මෙම මුදල් උපයෝජනය කර නොතිබුණි.

4.3 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

2012 දෙසැම්බර් 31 දිනට වූ ආයතනයේ කාර්යය මණ්ඩලය සහ පුරප්පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යයන අංශය			
මහාචාර්ය / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	04	04	-
පුස්තකාලයාධිපති / සහකාර පුස්තකාලයාධිපති හා විද්‍යාත්මක සහකාර	04	03	01
අනධ්‍යයන අංශය			
විධායක	05	05	-
ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි	15	15	-
කණිෂ්ඨ	08	07	01
	36	34	02

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

මහාචාර්ය පුරප්පාඩු දෙකක් වෙනුවට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙක් බදවා ගෙන තිබුණි.

4.4 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

සේවක පාරිතෝෂික සඳහා 2012 දෙසැම්බර් 31 වන දිනට රු.4,504,383 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබූ අතර අරමුදලක් ගොඩනැගීමට හා එම මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

4.5 වාහන පාලනය

කුලී පදනම් මත වාහන ලබාගැනීම.

2004 අගෝස්තු 31 දිනැති අංක 353/(5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, රු.40,000 සීමාවකට යටත්වූ මාසික කුලියකට පමණක් වාහන කුලියට ගත හැකි වුවද, එම චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව කි.මී. 1 ට රු. 36 බැගින් ගෙවීමේ පදනමට 2012 ජනවාරි 05 දින සිට 2012 අප්‍රේල් 05 දින දක්වා කාලයට වාහනයක් ලබාගෙන තිබුණි. එමෙන්ම ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව, යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු මගින් කුලී රථයේ ඉන්ධන දහනය පරීක්ෂා කර කි.මී. 1 ට රු. 41 ක බැගින් ගෙවීමට නිර්දේශ කිරීම හේතුවෙන් රු. 24,065 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

4.6 හදුනා ගන්නා ලද පාඩු

2012 වර්ෂයේ පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව අනුව, පුස්තකාලය ආරම්භ කළ දින සිට 2012 දෙසැම්බර් 31 දක්වා අස්ථාන ගත වී ඇති පොත් 122 ක වටිනාකම රු.33,211 ක් විය.

4.7 සෙමෙන් වලනය වන ශ්ලේෂ

2012 වර්ෂය ආරම්භයේදී ප්‍රකාශන 15 ක පොත් 4,462 කින් 2012 දෙසැම්බර් 14 දින වන විටත් අලෙවි වී තිබුණේ පොත් 23 ක් වන අතර එදිනට පොත් 4,438 ක තොගයක් පැවතුණි.

5 ගිණුම් කටයුතුහාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාර් සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ ක්‍රියාකාර් සැලැස්ම ඉටුකළ යුතු කාල පරාසය, වගකීම් පැවරීම සහ මූල්‍යනය පිළිබඳ විස්තර දැක්වෙන ලෙස නිශ්චිත ආකෘතියකට අනුව පිළියෙල කර නොතිබුණි.

(ආ) ආයතනයේ ක්‍රියාකාර් සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වූ ක්‍රියාකාරකම් 05 ක් වූ නමුත් එයින් එක් ක්‍රියාකාරකමක් ඉටුකර ගැනීමට නොහැකිවී තිබූ අතර අනෙකුත් ක්‍රියාකාරකම්වල සියයට 50 ක ප්‍රගතියක් විය.

5.2 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 120 දක්වා විචලනයන් වූයෙන් අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබුණි.

5.3 නොරිසදි ඇති විගණන පේද පිළිබද නිරීක්ෂණ

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයට භූමිභාගයක් ලබා ගැනීම

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය සඳහා ඉඩමක් මිලදී ගැනීමට 1996 වර්ෂයේදී ජාත්‍යන්තර බෞද්ධ පදනම විසින් ලබාදී තිබුණු රු.5,031,984 ක් ගොඩනැගිලි අරමුදල් ගිණුමට බැර කර ඊට සමාන මුදලක් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. නමුත් 2012 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමක් මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ,කුලී පදනම් මත ලබාගෙන තිබුණු ගොඩනැගිල්ලක ආයතනය පවත්වා ගෙන යනු ලබන අතර 2012 වර්ෂය සඳහා පමණක් ඒ වෙනුවෙන් ගෙවා තිබුණු කුලිය රු.4,695,000 ක් විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වර්ත්වර ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) විවිධ අත්තිකාරම්
(ඇ) ස්ථාවර වත්කම්
(ඈ) පුස්තකාල පරිපාලනය
(ඉ) පර්යේෂණ ආධාර
(ඊ) විභාග පරිපාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
වැඩබලන විගණකාධිපති.

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

POSTGRADUATE INSTITUTE OF PALI AND BUDDHIST STUDIES
UNIVERSITY OF KELANIYA - SRI LANKA

Sunethra Mahadevi Piriven Vidyayathana Premises
Pepiliyana, Boralesgamuwa.

සුනේත්‍රා මහාදේවි පිරිවෙන් විද්‍යායතන පරිශ්‍රය
පැපිලියාන, බොරලැස්ගමුව.

මගේ අංකය :
My No : PIPBS/ST/03/2013- 10

ඔබේ අංකය :
Your No :

2013.12.11

ලියාපදිංචි තැපෑල

වැඩ බලන විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ප්‍රිය මහත්මයාණෙනි,

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් අංක ඊසී/එප්/පිඅයිපිබී/එප්ජ්/2012 හා 2013.10.31 වැනි දිනැතිව එවා ඇති ලිපියට අනුව අදාළ පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරමි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් 2013 වර්ෂයේ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

මෙය දැනටමත් ගිණුම්ගත කර ඇත.

- අනෙක් පිට -

අධ්‍යක්ෂ
Director
011 3132323

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
Senior Assistant Registrar
011 2809322

ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
Senior Assistant Bursar
011 5839851

E-mail : pgipbs@sltnet.lk

සාමාන්‍ය/General 011 2809321

ෆැක්ස්/Fax 011 2809322

2.2.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

(අ) විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය

(i) XX වන ඡේදයේ 3(1) වගන්තිය සහ X වන පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය

අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා මෙවන් ක්‍රමයක් දැනට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ක්‍රියාත්මක නොවේ.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මු.රෙ. 104(2)

දැනටමත් මේ සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

(ii) මු.රෙ. 371

ඔබ විසින් පෙන්වා දී ඇති ආකාරයේ ප්‍රමාදයන් සිදු වී නොමැත. අදාළ අත්තිකාරම් පියවා ඇති දිනයන් පහත දක්වා ඇත.

වවුචර් අංක 184/1 රයිනා ප්‍රයිවට් ලිමිටඩ් යනුවෙන් සඳහන් වී තිබුනත් එය රසිකා සුබසිංහ මහත්මිය යනුවෙන් නිවැරදි විය යුතුය. තව ද මෙය ඇය වෙත කර ඇති මුදල් ප්‍රතිපූර්ණ කිරීමක් සඳහා සකස් කරන ලද ගෙවීම් පතකි. වැරදීමකින් අත්තිකාරම් ලේඛනයේ ලියවී ඇත.

වවුචර් අංක 435 හා 466 වවුචර්පත් සකස් කොට ඇත්තේ අවසාන ගෙවීම් සඳහාය. අත්තිකාරම් ලේඛනයේ සඳහන් වී ඇත්තේ වැරදීමකිනි.

වවුචර අංක 467 යටතේ ගෙවා ඇති අත්තිකාරම් මුදල පසුව ඇයටම ගෙවා ඇති වවුචර් අංක 485 මගින් මුදල් ගෙවීමේදී ඉහත අත්තිකාරම් පියවා ගෙන ඇත. මේ අනුව ඔබ විසින් පෙන්වා දී ඇති නොපියවා ඇති අත්තිකාරම් වශයෙන් පෙන්වා දී ඇති ඉහත වවුචර්පත් නොපියවන ලද අත්තිකාරම් වශයෙන් නොසලකන මෙන් ඉල්ලමි.

(iii) මු.රෙ. 756

මෙම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

(ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය

ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීම සඳහා කමිටුවක් හඳුනා ගෙන කටයුතු ආරම්භ කොට ඇති අතර 2013 වර්ෂයේ ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී මෙම වාර්තාව ද ඉදිරිපත් කරනු ඇත.

- අනෙක් පිට -

(ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

මේ සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇත.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>කාර්ය සාධනය</u>

(අ) <u>ශිෂ්‍ය ලියාපදිංචිය</u>

(i) සත්‍ය වේ. අදාළ පාඨමාලා සඳහා අයදුම් කරන ශිෂ්‍ය සංඛ්‍යාව සාමාන්‍යයෙන් අඩු මට්ටමක පවතී.

(ii) සත්‍ය වේ.

(iii) සත්‍ය වේ. අදාළ අයදුම්කරුවන් සංඛ්‍යාව ඉදිරි වර්ෂ වලදී වැඩි කර ගැනීමට පියවර ගනු ලැබේ.

(ආ) <u>විභාග වලට පෙනී සිටීම හා විභාග ප්‍රතිඵල.</u>

(i) සත්‍ය වේ. ආයතනයේ කටයුතු වලින් පරිබාහිර අදාළ ශිෂ්‍යයන්ට අනන්‍ය වූ හේතු මෙයට බලපෑ හැක.

(ii) සත්‍ය වේ. ඉදිරි කාලයේදී මෙම තත්වය මඟ හරවා ගැනීමට පියවර ගනු ලැබේ.

4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) සහ (ආ) හි පෙන්වා දී ඇති අරමුදල් පිහිටුවීමේ පරමාර්ථ හඳුනාගෙන එය කාර්යක්ෂම ආකාරයෙන් යොදවා ගැනීමට කටයුතු කරනු ඇත.

4.3 <u>කාර්ය මණ්ඩල පරිපාලනය</u>

අදාළ නොරතුරු සත්‍ය වේ. දැනට ඇති පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

4.4 <u>සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැඟීම</u>.

මේ සම්බන්ධයෙන් අදාළ පාර්ශ්වයන්ගෙන් අනුමැතිය සහ උපදෙස් වලට යටත්ව ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සටහන් කර ගෙන ඇත.

4.5 <u>වාහන පාලනය</u>

<u>කුලී පදනම මත වාහන ලබා ගැනීම</u>.

ආයතනයේ රියැදුරු තනතුරක් පුරප්පාඩු පැවති බැවින් හා ධාවන තත්වය අයහපත් වූ වාහනයක් ආයතනය සතුව තිබීම නිසා රියැදුරු සහිතව වාහනයක් ලබා ගැනීමේ අවශ්‍යතාව මත ඉහත වාහනය ලබා ගෙන ඇත. අදාළ කාලසීමාව තුළ ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් කරන ලද ඉල්ලීමට අනුව අදාළ .... ප්‍රමාණය වැඩිකර ඇත.

- අනෙක් පිට -

4.6 හඳුනා ගන්නා ලද පාඩු

නිවැරදියි.

4.7 සෙමෙන් චලනය වන ශේෂ

මේ සම්බන්ධයෙන් ගත හැකි ප්‍රායෝගික විසඳුම් සීමාසහිතය.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

(අ) ඉදිරි වර්ෂ වලදී මෙය නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

(ආ) අදාළ අපේක්ෂිත ක්‍රියාකාරකමක් වූ ආයතනය සඳහා ඉඩමක් ලබා ගැනීමේ කටයුතු දැනට ක්‍රියාත්මකය.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යම් යම් අවස්ථාවල පවතින ප්‍රායෝගික ගැටලු මත උපයෝගී කර ගැනිම අපහසු වී ඇත.

5.3 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

ආයතනයට ඉඩමක් ලබා ගැනීම පිළිබඳ කටයුතු දැනටමත් සිදු කෙරෙමින් පවතී.

6. පද්ධති හා පාලන

පද්ධති හා පාලන අඩුපාඩු වලින් තොරව කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ට උපදෙස් දී ඇත.

ඉහත වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සපයා ඇති පැහැදිලි කිරීම් පිළිබඳව මම පෞද්ගලිකව ම වගවන බව මෙයින් සහතික කරමි.

මෙයට,

මහාචාර්ය කොටපිටියේ රාහුල හිමි,
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ.
පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනය
(කැලණිය විශ්වවිද්‍යාලය)
සුනේත්‍රා මහා දේවි පිරිවෙන් විද්‍යායතන පරිශ්‍රය
පැපිලියාන, බොරලැස්ගමුව

පිටපත් : 01. උපකුලපති - කැලණිය විශ්වවිද්‍යාලය
02. සභාපති - විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාව
03. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
04. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය